# ශ්‍රී ලංකාව තුළ හඳුනාගැනෙන සුසාන ස්ථාන සංචාරක ප්‍රවර්ධනයට භාවිත කිරීම

ඩබ්.එස්.ඩී. බොතේජු[1] , කේ.කේ.පී.එම්. ජයතිලක[2]

ඉහළ සංචාරක ආකර්ෂණයන් සහිත පෙරදිග රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනාගත හැකි වෙයි. ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව ඇති සංස්කෘතික අගයන් මෙරට සංචාරක ප්‍රවර්ධනය උදෙසා දායක කරගත හැකිය. සුසාන යනු එලෙස අතීත මානව සමාජය තුළ ක්‍රියාත්මක වූ සමාජ සංස්කෘතික වටපිටාව හා බැඳී පවතින්නා වූ කරුණකි. සුසාන, මරණය ආදී කරුණු අඳුරු අවස්ථාවන් වුව ද කලක් ගතවීමේදී ඒ වෙත පවතින ශෝකාකුල හැඟීම වෙනස් වෙයි. මෙය වර්තමාන Cemeteries ආශ්‍රිතව ජනප්‍රියව හඳුනාගත හැකි ලක්ෂණයකි. මියගියවුන් හා එම අවස්ථා සිහිපත් කරමින් එම කරුණු සිහිවටන බවට පත්කර ගැනීමට ඔවුන් මෙහිදී කටයුතු කරයි. ඒ ඔස්සේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතාවක් වශයෙන් Cemetery Tourism වර්ධනය වෙමින් පවතියි. මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවෙහි සුසාන සංචාරක කරමාන්තය උදෙසා දායක කරගත හැකි වන්නේ ද යන්න හඳුනාගැනීම මූලික වශයෙන් ශ්‍රී ලංකා ඉතිහාසය තුළ අවධි ද්විත්වයකට අයත්ව සුසාන ස්ථාන ද්විත්වයක් තෝරාගන්නා ලදී. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියට අයත් ඉබ්බන්කටුව මහාශිලා සුසාන පරිශ්‍රය හා ගාලු කොටුවෙහි පිහිටි ඕලන්ද රෙපරමාදු දේවස්ථානයේ පවතින ලන්දේසි  යුගය සුසාන ස්මාරක  සහිත පරිශ්‍රය මෙලෙස තෝරාගන්නා ලද සුසාන පරිශ්‍රයන් ද්විත්වය ලෙස සඳහන් කළ හැකිය. ලෝකයේ සංචාරක කර්මාන්තය වෙත අවධානය යොමු කිරීමේ දී එහි සුසාන ස්ථාන විශාල වශයෙන් සංචාරකයින් අතර ප්‍රවර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව තුළ ද සුසාන ස්ථාන රැසක් පිහිටා ඇති අතර එම ස්ථානයන් ද ප්‍රවර්ධනය කිරීම උදෙසා ඉඩකඩ හඳුනාගනිමින් එතුළින් ඉහළ දායකත්වයක් සංචාරක කර්මාන්තය වෙත ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වෙයි. ශ්‍රී ලංකාවේ ඉබ්බන්කටුව මහාශිලා සුසානය සහ ගාල්ල ලන්දේසි සුසාන පරිශ්‍රය එලෙස ප්‍රවර්ධනය සඳහා යොමු කළ හැකි ස්ථාන වන අතර එය සංචාරකයින් වෙත ගෙනයෑම නැතිනම් ප්‍රවර්ධනය උදෙසා ගතහැකි පියවර මෙහි දී හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ පවතින ප්‍රවර්ධනය කර ඵලදායිව සංචාරක ක්ෂේත්‍රය වෙත භාවිත කළ හැකි මෙබඳු ක්ෂේත්‍ර ගණනාවක් පවතින අතර ඒ සියල්ල ආශ්‍රිතව පවත්නා ශක්තීන් හඳුනාගනිමින් නිවැරදිව සංචාරක ප්‍රවර්ධනය උදෙසා එම ස්ථාන යොදාගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වන ආකාරය මෙමඟින් පෙන්වා දෙනු ලැබේ.

ප්‍රමුඛ පද : සංචාරක කර්මාන්තය, සුසාන, ඉබ්බන්කටුව, ලන්දේසි සුසාන, ප්‍රවර්ධනය

[1 2] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.sithu.dil95@gmail.com